---

මිනුවන්ගොඩ නගර සභාව

ගම්පහ දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 02 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 21 දන ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 දෙසැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මිනුවන්ගොඩ නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති/ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු.840,407 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා මහජන බැංකුවේ ණයවාරික ගෙවීම් රු.200,000 ක් වැය ශීර්ෂ 52533ට ගිණුම් ගත කරනු වෙනුවට වැය ශීර්ෂ 34461ට ගිණුම් ගතකර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාලව ශේෂයන්ගේ එකතුව රු.16,811,489 ක්වූ අතර, ඒවාට අදාළ උපයෝගී ලේඛණ හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.8,742,244 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.28,909,466 ක් වූ ගනදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,018,257 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,825,192 ක් විය.

2.2 ආදායම් පර්පාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000ගි | රු.000ගි | රු.000ගි |
| (i.) වර්පනම් හා බදු | 7,501 | 8,535 | 6,027 |
| (ii.) බදු කුලී | 8,699 | 7,925 | 1,717 |
| (iii.) බලපත්‍ර ගාස්තු | 534 | 825 | 103 |
| (iv.) වෙනත් ආදායම් | 11,551 | 5,972 | 4,661 |

2.2.2 හිඟ වර්පනම් බදු අය කිරීම.

---

2010 සැප්තැම්බර් 30 දිනෙන් පසුව පවතින හිඟ වරිපනම් බදු සඳහා විනිග්‍රහන බලපත්‍ර නිකුත් **කර** නොතිබුණි.

(අ) හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා විනිග්‍රහන බලපත්‍ර නිකුත් කිරීමකින් තොරව, 2011 වර්ෂය සඳහා දේපල තහනම් කිරීමේ නිලධාරින්ට රු.83,949 ක කොමිස් මුදල් ගෙවා තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ සීඩී/2/3/වී හා 1975 ඔක්තෝබර් මස 13 දිනැති චක්‍රලේඛය අනුව දේපල තහනම් කිරීමේ නිලධාරින්ට කොමිස් ලබා ගැනීම සඳහා ක්ෂේත්‍රයේදී වරෙන්තුවේ සඳහන් පරිදි වරිපනම් මුළු හිඟ මුදලම අයකර ගැනීම කළයුතු වුවද, එයට පටහැනිව හිඟ මුදලින් කොටසක් අයකිරීම් වෙනුවෙන්ද කොමිස් මුදල් ගෙවා තිබුණි.

2.3 ලැබිය යුතු ගිණුම්

---

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පෙර ගෙවුම් ශේෂය රු. 4,955,235 ක් විය.

3. පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය කළමනාකරණය